

# නිබ්බාන පටිපදා

# දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය

# උත්තරීතර නිර්වාණ මාර්ගය

## ආස්වාද - ආදීනව - නිස්සරණ

යං ඛො පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං අස්සාදො.

යමක් හේතුවෙන් සැපක්, සොම්නසක් උපදීද, මේ, ලෝකයෙහි ආශ්වාදයයි.

යං අනිච්චං දුක්ඛං විපරිණාමධම්මං, අයං ආදීනවො.

යමක් අනිච්චද, දුක්ඛද, විපරිණාම ස්වභාවය ඇත්තේද, මේ එහි ආදීනවයයි.

යො ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං, ඉදං නිස්සරණං.

එහි ඡන්දරාගය දුරුකිරීමක්, ඡන්ද රාගය පහකිරීමක් වේද, මේ නිස්සරණයයි.

# දුක හට ගැනීම / සමුදය

සිතෙහි රාගය, ද්වේෂය, මෝහය උපදින්නේ ආස්වාදය සැප වශයෙන් අනුවණ පරිද්දෙන් මෙනෙහි වීම / අනුවණ පරිද්දෙන් දැකීම නිසා ය. සිතෙහි රාග, ද්වේෂ, මෝහ චේතනා උපදින වාරයක් වාරයක් පාසා කර්ම ශක්තිය ජනිත වේ (චේතනාහං භික්ඛවේ කම්මං වදාමි). කර්ම ශක්තිය තුළින් මෙලොව වශයෙන් සහජාත භවයත්, පරලොව වශයෙන් පුනර්භවයත් සකස් වේ. රාග ගින්දර, ද්වේෂ ගින්දර, මෝහ ගින්දර හේතුවෙන් මෙලොව සහජාත භවය (මෙලොව ජීවිතය) දැවේ. රාග, ද්වේෂ, මෝහ චේතනා තුළින් හට ගන්නා කර්ම විපාක හේතුවෙන් පරලොව පුනර්භවය (පරලොව ජීවිතය) දැවේ. රාග, ද්වේෂ, මෝහ හේතුවෙන් මෙසේ දෙලොවම දැවේ. ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස, රාග, ද්වේෂ, මෝහ යන එකොළොස් ගින්නෙන් මුළු සංසාරයම දැවේ.

කර්ම ශක්තිය තුළින් කර්ම භවය සකස් වේ, වර්ධනය වේ. කර්ම භවය හේතුවෙන් පුනර්භවය සකස් වේ. පුනර්භවය හේතුවෙන් නැවත නැවත ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස දුක්ඛස්කන්ධය පහළ වේ. සසර දුක නිර්මාණය වේ.

භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං සොක පරිදෙවානං දුක්ඛ දොමනස්ස උපායාසා සම්භවන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

# දුක අවසන්වීම / නිරෝධය

පරම උත්තරීතර බුදු බණ අසා චතුරාර්ය සත්‍යය අවබෝධ කිරීමෙන් සසරේ යථාර්ථය නුවණින් දැකිය හැකි වේ. එවිට කාමය යනු, ආස්වාදය යනු සසර දුක උදා කරන මාරයාගේ මර උගුල, මළ පුඩුව බව ප්‍රඥාවට දර්ශනය වෙයි. කාමය, ආස්වාදය පසුපස හඹා යාම, දුක පසුපස හඹා යාම බව ප්‍රඥාවට ප්‍රත්‍යක්ෂ වෙයි.

එවිට එම සුතවත් අරිය සාවකයාගේ චින්තනය පටිසෝතගාමී හෙවත් පෘථග්ජන අඥාන ලෝක චින්තනයට ප්‍රතිගාමී, ප්‍රතිවිරුද්ධ, ලෝකෝත්තර චින්තනයට පරිවර්තනය වෙයි. එම ලෝකෝත්තර චින්තනයෙන් යුක්තව කල් ගෙවන අරිය සාවකයාට නිරන්තරයෙන් කාමයේ, ආස්වාදයේ ආදිනව ප්‍රඥාවට ගෝචර වෙයි. එසේ කාමයේ, ආස්වාදයේ ආදිනව නුවණින් දකිමින් වාසය කිරීම තුළ, සිතෙහි හට ගන්නා රාග, ද්වේෂ, මෝහ චේතනා නිරෝධ වෙයි. ක්‍රම ක්‍රමයෙන් රාගය, ද්වේෂය, මෝහය නූපදින තත්වයට පත්වෙයි. රාග, ද්වේෂ, මෝහ චේතනා හට නොගැනීම නිසා එම සිතෙහි කර්ම ශක්තිය ජනිත නොවෙයි. එබැවින් කර්ම භවය සකස් නොවෙයි. කර්ම භවය නිරුද්ධ වී යයි. කර්ම භවය මුළුමනින්ම අවසන් වීමෙන් පුනර්භවයද අවසන් වෙයි. එබැවින් නැවත ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස දුක්ඛස්කන්ධය පහළ නොවෙයි. සසර එකොළොස් ගින්න සදහටම නිවී යයි. සසර දුක සදහටම අවසන් වෙයි.

භව නිරොධා ජාති නිරොධො, ජාති නිරොධා ජරා මරණං සොක පරිදෙවානං දුක්ඛ දොමනස්ස උපායාස නිරුජ්ඣන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

# ආස්වාදයේ 06 ආකාරය

**යං ඛො චක්ඛුං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං චක්ඛුස්ස අස්සාදො.**

**ඇස හේතුවෙන් යම් (ඇසත් රූපත් එකිනෙක ස්පර්ශ වීමෙන්) සතුටු සහගත සැප වේදනාවක් සිතෙහි උපදීද, මෙය ඇසෙහි ආස්වාදයයි.**

**යං ඛො සොතං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං සොතස්ස අස්සාදො.**

**කණ හේතුවෙන් යම් (කණත් ශබ්දත් එකිනෙක ස්පර්ශ වීමෙන්) සතුටු සහගත සැප වේදනාවක් සිතෙහි උපදීද, මෙය කණෙහි ආස්වාදයයි.**

**යං ඛො ඝානං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං ඝානස්ස අස්සාදො.**

**නාසය හේතුවෙන් යම් (නාසයත් ගන්ධත් එකිනෙක ස්පර්ශ වීමෙන්) සතුටු සහගත සැප වේදනාවක් සිතෙහි උපදීද, මෙය නාසයෙහි ආස්වාදයයි.**

**යං ඛො ජිව්හාං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං ජිව්හාස්ස අස්සාදො.**

**දිව හේතුවෙන් යම් (දිවත් රසත් එකිනෙක ස්පර්ශ වීමෙන්) සතුටු සහගත සැප වේදනාවක් සිතෙහි උපදීද, මෙය දිවෙහි ආස්වාදයයි.**

යං ඛො කායං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං කායස්ස අස්සාදො.

කය හේතුවෙන් යම් (කයත් ඵොට්ඨබ්බත් එකිනෙක ස්පර්ශ වීමෙන්) සතුටු සහගත සැප වේදනාවක් සිතෙහි උපදීද, මෙය කයෙහි ආස්වාදයයි.

යං ඛො මනං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං මනස්ස අස්සාදො.

මනස හේතුවෙන් යම් (මනසත් ධර්මත් එකිනෙක ස්පර්ශ වීමෙන්) සතුටු සහගත සැප වේදනාවක් සිතෙහි උපදීද, මෙය මනසෙහි ආස්වාදයයි.

මෙසේ 06 ආකාරයකට ස්පර්ශ ආයතන ඇසුරු කොටගෙන උපදින්නා වූ ආස්වාදය පිළිබඳ මස් ඇසට නොපෙනෙන යථාර්ථය හෙවත් එම සියලු ආස්වාදයන්ගේ ආදිනව ප්‍රඥා ඇසින් විමසා බැලිය යුතු ය.

ආස්වාදයේ ආදිනව පහත පරිදි, අනිච්ච දුක්ඛ අනත්ත ත්‍රිලක්ෂණයට බහා 40 ආකාරයකට නුවණින් දැකිය යුතු ය. අසුභ ලක්ෂණයට බහා නුවණින් දැකිය යුතු ය. එවිට කාමය, ආස්වාදය, පංච උපාදානස්කන්ධය යන සියල්ල කෙරෙහි පවත්නා ඡන්දරාගය, තණ්හාව සිතින් ක්‍රම ක්‍රමයෙන් දුරු වී යයි.

# ආසෙවිතාය භාවිතාය බහුලීකතාය

සියලු කෙලෙස් ප්‍රහාණය උදෙසා මෙම සමථ විදර්ශනා ඥාණ මාර්ගය නිරතුරු බහුලව භාවිත කිරීම, අඛණ්ඩව අත් නොහැර භාවිත කිරීම, මනාකොට ප්‍රගුණ කරමින් භාවිත කිරීම, පිළිවෙලක් සැලසුමක් ඇතිව භාවිත කිරීම, නොපසුබස්නා වීර්යයෙන් යුතුව භාවිත කිරීම, දැඩි අධිෂ්ඨානයෙන් යුක්තව භාවිත කිරීම, නිවන කෙරෙහි වූ ප්‍රමුඛ කැමැත්ත ඇතිව භාවිත කිරීම, සියලු අකුසලයන් දුරු කරමින් භාවිත කිරීම, සියලු කුසලයන් වඩමින් භාවිත කිරීම, සියල්ල පිළිබඳ සිහි නුවණින් භාවිත කිරීම, ජීවිතයට ගළපමින් භාවිත කිරීම, ජීවන අත්දැකීම් හා සසඳමින් භාවිත කිරීම, ඒ ඒ මොහොතට ගළපමින් භාවිත කිරීම, වර්තමානය තුළ පිහිටා භාවිත කිරීම, තමන් අනුව දකිමින් භාවිත කිරීම, අනුන් අනුව දකිමින් භාවිත කිරීම, සතර ඉරියව්වේදීම භාවිත කිරීම, හුස්මක් හුස්මක් පාසා භාවිත කිරීම, සසරේ ආදීනව දකිමින් භාවිත කිරීම, නිවනේ ශාන්තිය අත් දකිමින් භාවිත කිරීම, නිවනේ සිත පිහිටුවමින් භාවිත කිරීම, බුද්ධ භාවනාව නොහොත් සතර සතිපට්ඨානය නම් වෙයි.

## කායානුපස්සනාව

අත්භව සකස් වී ඇති චක්ඛු කාය - සෝත කාය - ඝාන කාය - ජිව්හා කාය - කාය කාය - මනෝ කාය සහ රූප කාය - සද්ද කාය - ගන්ධ කාය - රස කාය - ඵොට්ඨබ්බ කාය - ධම්ම කාය යන අභ්‍යන්තර බාහිර සියලු කායන්ගේ යථා ස්වභාවය ත්‍රිලක්ෂණයට හා අසුභ ලක්ෂණයට අනුකූලව නුවණින් දැකීම කායානුපස්සනාවයි.

## වේදනානුපස්සනාව

ඒ ඒ මොහෙතෙහි සප්ර්ශයෙන් හට ගන්නා දුක්ඛ වේදනා, සුඛ වේදනා, අදුක්ඛමසුඛ වේදනා යන සියලු වේදනාවන්ගේ යථා ස්වභාවය නුවණින් දැකීම වේදනානුපස්සනාවයි.

## චිත්තානුපස්සනාව

ඒ මොහොතෙහි හට ගන්නා සිත්වල යථා ස්වභාවය ත්‍රිලක්ෂණයට හා අසුභ ලක්ෂණයට අනුකූලව නුවණින් දැකීම චිත්තානුපස්සනාවයි.

## ධම්මානුපස්සනාව

ඒ ඒ මොහෙතෙහි ක්‍රියාත්මක ධර්මයන්ගේ (සමුදය ධර්ම / නිරෝධ ධර්ම) යථා ස්වභාවය ත්‍රිලක්ෂණයට හා අසුභ ලක්ෂණයට අනුකූලව නුවණින් දැකීම ධම්මානුපස්සනාවයි.

# අනිච්ච ලක්ෂණ (09)

**අනිච්චතොති -** ආස්වාදය මෙලොව පරලොව දුකක්ම, විනාශයක්ම උරුම කර දී ගෙවී අවසන් වන බැවින් ක්ෂය ධර්මයකි. එය විනාශය අත් කරදෙමින් විනාශ වී යයි. එය හේතු නිරෝධයෙන් අවසන් කළ යුතු බැවින් වය ධර්මයකි. (හේතුං පටිච්ච සම්භූතං - හේතු භංගා නිරුජ්ඣති - හේතු නිසා උදාවන, හේතු නැසීමෙන් නිරෝධවන ධර්මයකි.)

රාග අනුසයෙන් ඇතිවන සම්ඵස්සයෙන් (රාග සම්ඵස්සය) ආස්වාදය ඒ මොහොතේදි තාවකාලිකව හට ගනියි. රාග අනුසය පහ කිරීමෙන්, නිරෝධ කිරීමෙන්, නිරෝධ වීමෙන් රාග සම්ඵස්සය නිරෝධ වේ. රාග සම්ඵස්සය නිරෝධ වීමෙන් ආස්වාදය හට නොගනියි. (ඵස්ස නිරොධා වෙදනා නිරොධො). එබැවින් ආස්වාදය නිශ්චිතව, ඒකාකාරව නොපවතින හේතුඵල මායාවක් වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.

**පලොකතොති -** ආස්වාදයද පළුදු වේ. විනාශ වේ. ආස්වාදය ඇති කරන සියල්ලද, ආස්වාදය පතා ළං කරගත් සියල්ලද පළුදු වේ. විනාශ වේ. කයද පළුදු වේ. විනාශ වේ. සිතද පළුදු වේ. විනාශ වේ. මෙලොවද පරලොවද විනාශයක්ම අත් කර දෙයි. ආස්වාදය සැපය යැයි මුළාවෙන් ළං කර ගන්නා සත්වයා විනාශයක්ම ළං කර ගනියි. විනාශයක්ම අත් කර ගනියි. (පලොකධම්මං, අයං වුච්චති අරියස්ස විනයෙ ලොකො.) එබැවින් ආස්වාදය විනාශය වශයෙන් නුවණින් දැකිය

**යුත්තාහ.**

**චලතොති -** ආස්වාදය විවිධ විචල්‍යාන්ට ලක් වේ. ආස්වාදය නිසා සිතද චපල / චංචල වේ. සැලෙන්නේ වේ. කයද සැලෙන්නේ වේ. ආස්වාදය ඇති කරන සියල්ලද, ආස්වාදය පතා ළං කරගත් සියල්ලද සැලෙන්නාහුය. කම්පා වන්නාහු ය. ආස්වාදය මුළාවෙන් ළං කර ගන්නා සත්වයා කම්පාවම ළං කර ගනියි.

ඉත්ථෙතෙපි ධම්මා චලා චෙව ඛ්‍යථා ච අනිච්චා විපරිණාමිනො අඤ්ඤථාභාවිනො. මෙසේ මේ ධර්මයෝද සැලෙන්නාහුය. විනාශ වන්නාහුය. අනිච්චයහ. විපරිණාමය වන ස්වභාවය ඇත්තාහුය. අන්‍ය භාවයකට පත්වන්නාහුය.

නිස්සිතස්ස චලිතං, අනිස්සිතස්ස චලිතං නත්ථි. තෘෂ්ණාදිය ඇසුරුකළහුට කම්පාවීම වේ. ඇසුරු නොකළහුට කම්පාවීමක් නැත. **එබැවින් ආස්වාදය කම්පාව / චලනය වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.**

**පභඞ්ගුතොති -** ආස්වාදයද බිඳී බිඳී යයි. ආස්වාදය ඇති කරන සියල්ලද, ආස්වාදය පතා ළං කරගත් සියල්ලද බිඳී බිඳී යයි. ක්ෂණයක් ක්ෂණයක් පාසා සිතද බිඳෙයි. කයද බිඳෙයි. ආස්වාදය පතා යමක් ළං කර ගන්නා සත්වයා, බිඳෙන්නක්ම, බිඳ වැටෙන්නක්ම, බිඳී යන්නක්ම ළංකර ගනියි.

රූපං භික්ඛවෙ, පභඞ්ගුතො .... මහණෙ, රූපය බිඳෙන සුළු ය.

වෙදනා, සඤ්ඤා, සංඛාරා, විඤ්ඤාණං පෙ... **එබැවින් ආස්වාදය බිඳීම, බිඳ වැටීම වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.**

**අද්ධුවතොති -** ආස්වාදය ස්ථිර නොවේ. එය හේතුඵල ධර්මයක් නිසා සදාකාලික නොවේ. ආස්වාදය ඇති කරන සියල්ලද, ආස්වාදය පතා ළං කරගත් සියල්ලද අස්ථිර වේ. ස්ථිර පැවැත්මක් නොවේ. අස්ථිර වූ අස්වාදය තුළින් ස්ථිර සැපයක් අපේක්ෂා කරන සත්වයාට ඒකාන්ත දුකක්ම උරුම වෙයි.

එවං අනිච්චා, භික්ඛවෙ, සඞ්ඛාරා, එවං අද්ධුවා, භික්ඛවෙ, සඞ්ඛාරා, එවං අනස්සාසිකා, භික්ඛවෙ, සඞ්ඛාරා. යාවඤ්චිදං භික්ඛවෙ, අලමෙව සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං, අළං විරජ්ජිතුං, අළං විමුච්චිතු'න්ති.

මහණෙනි, සංස්කාරයෝ මෙසේ අනිච්චයහ. මහණෙනි, සංස්කාරයෝ මෙසේ අස්ථිරයහ. මහණෙනි, සංස්කාරයෝ මෙසේ සැනසීම් රහිතයහ. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නො ඇලීමට සුදුසුමය. ඔවුන් කෙරෙන් මිදීමට සුදුසුමය. **එබැවින් ආස්වාදය අස්ථිරභාවය / අස්ථිර ධර්මය වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.**

**විපරිණාමධම්මතොති -** ආස්වාදය වෙනස් වෙමින් විනාශය කරා පෙරළෙයි. ආස්වාදය ඇති කරන සියල්ලද, ආස්වාදය පතා ළං කරගත් සියල්ලද වෙනස් වෙමින් විනාශය කරාම පෙරළෙයි. යම්

සත්වයෙක් යමක ආස්වාදය සලකා සැප පිණිස ළං කර ගන්නේද, එහි විපරිණාමය හේතුවෙන් ඔහු මොහොතක් මොහොතක් පාසා දුකටම, අසහනයටම පත් වන්නේ ය.

සබ්බං අනිච්චං දුක්ඛං විපරිණාම ධම්මං - සියල්ල අනිච්ච වේ, දුක්ඛ වේ, විපරිණාම ධර්ම වේ. සබ්බෙහි මෙ පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවොති - ප්‍රිය වූ මනාප වූ සියල්ල අන්‍යභාවයට පත් වෙමින් විනාශය කරා පෙරළෙයි. **එබැවින් ආස්වාදය විනාශය කරා පෙරළීම වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.**

**විභවතොති -** ආස්වාදය ක්‍රම ක්‍රමයෙන් අභාවය කරා ගමන් කරයි. ආස්වාදය ඇති කරන සියල්ලද, ආස්වාදය පතා ළං කරගත් සියල්ලද ක්‍රම ක්‍රමයෙන් අභාවය කරා ගමන් කරයි. සබ්බෙහි මෙ පියෙහි මනාපෙහි නානාභාවොති, විභවො'ති. ප්‍රිය වූ මනාප වූ සියල්ල අන්‍යභාවයට පත් වෙමින් අභාවය කරා ගමන් කරයි.

රූපස්ස විභවා, වෙදනාය විභවා, සඤ්ඤා විභවා, සඞ්ඛාරානං විභවා, විඤ්ඤාණස්ස විභවා, - රූපය අභාවයට පත් වෙයි. වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ පෙ.... **එබැවින් ආස්වාදය අභාවය වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.**

**සංඛතතොති -** ආස්වාදය හේතු ප්‍රත්‍ය නිසා සකස් වන්නකි. ආස්වාදය රාග සම්ඵස්සයෙන් හට ගනී. ආස්වාදය ඇති කරන සියල්ලද, ආස්වාදය පතා ළං කරගත් සියල්ලද හේතු ප්‍රත්‍ය තුළින් සකස් වූ ප්‍රපංච ධර්ම වේ. සියල්ලට අවිජ්ජාව හේතු වේ. පංචස්කන්ධයට අයත් වන සියලුම රූප (28 ආකාර

රූප), සියලුම චෛතසික (52 ආකාර චෛතසික), සියලුම සිත් (89 ආකාර චිත්ත) සංඛත ධර්මයෝ ය. එනම් රාග, ද්වේෂ, මෝහ චේතනා නිසා ජනිත වූ කර්ම ශක්තියෙන් පහළ වූ තාවකාලික ලෝක ධර්මයෝ ය.

තීණිමානි, භික්ඛවෙ, සඞ්ඛතස්ස සඞ්ඛතලක්ඛණානි. කතමානි තීණි? උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති. - මහණෙනි, හේතු ප්‍රත්‍යයෙන් සකස් වූ ධර්මයාගේ ලක්ෂණයෝ තුන් දෙනෙක් වෙත්. කවර තුන් දෙනෙක්ද යත්, හටගැනීමක් ප්‍රකටය, අවසානයක් (නිරෝධයක්) ප්‍රකට ය, සිටියෙකුගේ අන්‍ය භාවයක් ප්‍රකටය, මහණෙනි, මේ සංඛතයාගේ ලක්‍ෂණ තුන වෙත්. එබැවින් ආස්වාදය ඇතුළු සියල්ල රාග, ද්වේෂ, මෝහ තුළින් සකස් වූ ධර්ම නොහොත් සංඛත වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.

---

මරණධම්මතොති - මරණයට හේතුව ඉපදීමයි. ඉපදීමට හේතුව තණ්හාවයි. තණ්හාවට හේතුව ආස්වාදයයි. ආස්වාදය මරණය උරුම කර දෙන ධර්මයකි. ආස්වාදය මරණයද, මරණය හා සමාන දුකද ගෙන දෙයි. ආස්වාදය ඇති කරන සියල්ලද, ආස්වාදය පතා ළං කරගත් සියල්ලද මරණයට පත් වේ. සියල්ල ක්ෂණික මරණ, අවස්ථා මරණයන්ටද ගොදුරු වෙයි. අවාසනයේ සියල්ල සියලු ආකාරයෙන් මරණයට පත් වෙයි. යමෙක් සැප යැයි ආස්වාදය පතන්නේද, ඔහු පතන්නේ මරණයයි.

න හි සො උපක්කමො අත්ථි, යෙන ජාතා න මියාරෙ, ජරම්පි පත්වා මරණං, එවංධම්මා හි පාණිනො. උපන්නා වූ යමක් යමෙක් නොමැරෙත්ද, එබඳු උපක්‍රමයක් නැත්තේය. ජරාවට පැමිණ හෝ නොපැමිණ මරණයවේ. මෙය සත්වයාගේ ධර්මතා නියමයයි.

පරිජිණ්ණමිදං රූපං, රොගනීළං, පභඞ්ගුරං, භිජ්ජති පූතිසන්දෙහො, මරණන්තඤ්හි ජීවිතං. මේ රූපය ඉතා දිරාගියේ ය. රෝගයන්ට (නිවාසස්ථාන හෙයින්) කූඩුවක් බඳු ය. වහා නැසෙන සුලුය. මේ කුණුකය නොබෝ කලකින් බිඳෙන්නේය. කුමක් හෙයින්ද යත්? යම් හෙයිකින් ජීවිතය මරණයම අන්තකොට ඇති හෙයිනි. මරණධම්මොම්හි මරණං අනතීතොති - මම මැරෙන ස්වභාව ඇත්තේ වෙමි. මරණය නො ඉක්ම වූයෙමි. **එබැවින් ආස්වාදය මරණය වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.**

## දුක්ඛ ලක්ෂණ (25)

**දුක්ඛතොති -** සියලු දුක්ඛ දෝමනස්ස උදා කර ගෙන දෙන උපාදානයන්ට හේතුව ආස්වාදය කෙරෙහි ඇති ඡන්දරාගය බැවින්, ආස්වාදය යනු දුකට නමකි. දුක්ඛෝති භික්ඛවේ, කාමානමෙතං අධිවචනං. මහණ, කාමය යනු දුකට පරියාය නාමයකි.

යං කිඤ්චි දුක්ඛං උප්පජ්ජන්ති, සබ්බත්තං ඡන්ද මූලකං ඡන්ද නිදානං, ඡන්දොහි මූලං දුක්ඛස්සාති. යම්කිසි දුකක් උපදින්නේද, ඒ සියලු දුක්ඛයන්ට ආස්වාදය පිළිබඳ ආශාව මුල් වේ. ආස්වාදය පිළිබඳ ආශාව නිදාන වේ. ආස්වාදය පිළිබඳ ආශාව දුකෙහි මූලය වේ. මේ සියලු දුක් රැස ආස්වාදය හේතුවෙන්ම උදා වන්නකි. **එබැවින් ආස්වාදය දුක වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.**

**රොගතොති -** ආස්වාදය බොහෝ වේදනා ගෙන දෙන, සුව නොවන රෝගයක් බඳු ය. කෙළෙස් රෝගයට හේතුව ආස්වාදයයි. සියලු කායික චෛතසික රෝගයන්ට හේතුව ආස්වාදය හඹා ආ සසර

ගමනයි.

ආතුරො හායං, කායො අණ්ඩභූතො පරියොනද්ධො. යො හි, ඉමං කායං පරිහරන්තො මුහුත්තම්පි ආරොග්‍යං පටිජානෙය්‍ය, කිමඤ්ඤත්‍ර බාල්‍යා? තස්මාතිහ තෙ, එවං සික්ඛිතබ්බං - ‘ආතුරකායස්ස මෙ සතො චිත්තං අනාතුරං භවිස්සතී’ති. - මේ කය ආතුරවූයේ වෙයි. බිජු වටක් මෙන් දුබල වූයේ වෙයි. සියුම්වූ සිවියකින් දැවටුනේ වෙයි. යමෙක් යම් කය පරිහරණය කරන්නේ මොහොතක් නමුත් ආරෝග්‍යය (නිරෝගී බව) ප්‍රතිඥා කරන්නේ නම් (එය ඔහුගේ) අඥාන බව හැර වෙන කුමක්ද? එහෙයින් තොප විසින් මෙහි මෙසේ හික්මිය යුතු ‘ආතුරවූ කයක් ඇත්තාවූ මාගේ සිත අනාතුර වන්නේය’ කියායි. ඉති ඉමස්මිං කායෙ විවිධා ආබාධා උප්පජ්ජන්ති - මේ ශරීරය බොහෝ දුක්ය, බොහෝ දෝෂ සහිත ය. විවිධ අබාධ රෝග හට ගනියි.

රෝගොති භික්ඛවේ, කාමානමෙතං අධිවචනං. මහණ ආර්ය විනය තුළ රෝගය යනු කාමයට නමකි.

ආරෝග්‍ය පරමා ලාභා - ආරෝග්‍ය යනු කාමයෙන් වෙන්වීම නොහොත් නෙක්කම්මයයි. නෙක්කම්මය පරම ලාභය වන නිවන අත්කර දෙයි. එබැවින් ආස්වාදය රෝගය වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.

**ගණ්ඩතොති -** ආස්වාදය බොහෝ වධ වේදනා උරුම කර දෙන බැවින්, නිරන්තර පීඩා ඇති කර බැවින් ශරීරයේ හටගත් ගෙඩියක්, පිළිකාවක් බඳු ය.

ගණ්ඩොති ඛො, භික්ඛවෙ, ඉමස්සෙතං චාතුමහාභූතිකස්ස කායස්ස අධිවචනං - ආස්වාදය හේතුවෙන් සතර මහා ධාතුවෙන් හටගත් කයද ගණ්ඩයකි. එබැවින් ආස්වාදය ගණ්ඩය

වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.

**අඝතොති -** ආස්වාදය විසල් ඝට්ටනයන්ට (ගැටීම්වලට), දුක් ගැහැටවලට මග පාදන හෙයින්, මහා ඝට්ටනයක් බඳු ය.

රූපං, භික්ඛවෙ, අඝං, වෙදනා අඝං, සඤ්ඤා අඝං, සඞ්ඛාරා අඝං, විඤ්ඤාණං අඝං. ඉදං වුච්චති, භික්ඛවෙ, අඝං. මහණෙනි, රූපය ඝට්ටනයකි. වේදනාව ඝට්ටනයකි. සංඥාව ඝට්ටනයකි. සංස්කාර ඝට්ටනයකි. විඤ්ඤාණය ඝට්ටනයකි. මහණෙනි, මෙ ඝට්ටනය යැයි කියනු ලැබේ. එබැවින් ආස්වාදය ඝට්ටනය (ගැටුම) වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.

**සල්ලතොති -** සත්වයා තුළ තියුණු දුක් වේදනා, ශෝක සන්තාප ඇති කරන බැවින්ද, තියුණු දුක් සහිත සතර අපාය උරුම කර දීමට හේතුවන බැවින්ද, ආස්වාදය තියුණු හුලක් (උලක්) බඳුය. ආස්වාදය යනු සිතෙහි ඇනෙන උලකි.

සත්තිසූලූපමා කාමා, ඛන්ධාසං අධිකුට්ටනා - කාමයෝ, ශරීර කොටන ආයුධයක් හා හුලක් වැනියහ. එබැවින් ආස්වාදය හුල වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.

**අතාණතොති -** ආස්වාදයෙන් මත් වූ සිත, සැම විටම අකුසලයටම නැඹුරු වන හෙයින්, කුසලයෙන්, ධර්මයෙන් රැකවරණයක් නොමැත. ආස්වාදය පසුපස හඹා යන්නාට භයංකාර සසර තුළ රැකවරණයක් නොමැත. සතර අපායෙන්ද ගැලවීමක් නොමැත. ආස්වාදය හඹා යාමෙන්

ආරක්ෂාව අහිමි වේ. **එබැවින් ආස්වාදය අනාරක්ෂාව වශයෙන් (අනාරක්ෂිත බව වශයෙන්) නුවණින් දැකිය යුත්තාහ.**

**අලෙණතොති –** ආස්වාදය පතන සිත, අකුසලය තුළම ගිලී පසුවන බැවින්, සෑම කල්හිම, අනාරක්ෂිත ස්ථානයක වාසය කිරීමක් බඳු ය. ආස්වාදය හඹා යන්නාට තම සිතම අනාරක්ෂිත ස්ථානයකි. ආස්වාදය හේතුවෙන් උදාවන ජරා, ව්‍යාධි, මරණ ආදි දුක්වලින් සැඟවී සිටින්නට ආරක්ෂිත ස්ථානයක් නොමැත. සසර දුකින් ගැලවී සැඟවී සිටින්නට ආරක්ෂිත ස්ථානයක් නොමැත. **එබැවින් ආස්වාදය අනාරක්ෂිත ස්ථානය (පිහිටක් නැති ස්ථානය) වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.**

**අසරණතොති –** ආස්වාදයට බර වූ සිත, අකුසලයම ආධාර කර පවතින බැවින්, කුසලයෙන්, ධර්මයෙන් පිළිසරණක් නොමැත. ආස්වාදය හේතුවෙන් උතුම් වූ ත්‍රිවිධ රත්නයේ සරණද නොලැබී යයි. එබැවින් ආස්වාදය පතන්නා සෑම කල්හිම සසර තුළ අසරණ ය. ආස්වාදය හේතුවෙන් බොහෝ අසරණභාවයන්ට පත් වේ. **එබැවින් ආස්වාදය අසරණ බව වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.**

**ආබාධතොති -** නිරතුරු අසහනය, පෙළීම ඇතිකරන බැවින්, ආස්වාදය ආබාධයක් බඳු ය. කායික සහ චෛතසික වශයෙන් විවිධ ආබාධයන්ට මග පාදන බැවින් ආස්වාදය ආබාධයකි. **එබැවින්**

ආස්වාදය ආබාධය වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.

ඊතිතොති - ආස්වාදයට නැඹුරු වූ සිත දුක්ඛ දෝමනස්ස සහිත අප්‍රමාණ විපත්ම උරුම කර දෙයි. සසර විපතෙහි තෝතැන්නයි. සියලු සතුන් විපත්වලට මුහුණ දෙන්නේ ආස්වාදය හඹා යාම නිසා ය. එබැවින් ආස්වාදය විපතකි. එබැවින් ආස්වාදය විපත වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.

අඝමූලතොති - ආස්වාදයට ඇති කැමැත්ත, ආශාව දුකට ගැටුමට මුල ය. ආශාව විනාශයට ගැටුමට මුල ය. ආස්වාදය පතා විනාශයක්ම, දුකක්ම, ගැටුමක්ම උදා කර ගනියි.

යායං තණ්හා පොනොභවිකා නන්දීරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනී; සෙය්‍යථීදං - කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා. ඉදං වුච්චති, භික්ඛවෙ, අඝමූල’න්ති. - යම් ඒ නැවත නැවත ඉපදීම ඇති කරන්නාවූ, නන්දිරාගය සහිතවූ ඒ ඒ භවයෙහි ඇලෙන්නාවූ යම් ඒ තෘෂ්ණාවක් වේද, එනම්, කාම තණ්හාවය, භව තණ්හාවය, විභව තණ්හාවය යන මොහුයි. මහණෙනි, මේ දුකට ගැටුමට මුලයි. එබැවින් ආස්වාදය දුකෙහි ගැටුමෙහි මූලය වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.

වධකතොති - සසරෙහි අනේක වධ බන්ධන දුක් ගැහැට උරුම කර දෙන බැවින් ආස්වාදය වධකයෙකු බඳු ය. ආස්වාදය පතන ලෝක සත්වයා මෙලොවත් පරලොවත් අප්‍රමාණ වධ බන්ධනවලට මුහුණ දෙයි. නිරය ඇතුළු සතර අපායේ අප්‍රමාණ වධ හිංසනවලට ලක්වෙයි. එබැවින් ආස්වාදය වධකයා වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.

| |
|---|
| **මාරාමිසතොති -** ආස්වාදය පතන්නා මාරයාටම ගොදුරු වේ. මාරයාටම ආහාර වේ. ආස්වාදය නිසා රාග ද්වේෂ මෝහ චේතනා උපදී. එය මාරයාගේ (විඥානයේ) ආහාරය වේ. (සංඛාර පච්චයා විඤ්ඤාණං). එබැවින් ආස්වාදය යනු මාරයාගේ ආහාරය වශයෙන් නුවණින් දැකිය යුත්තාහ. |
| **ජාතිධම්මතොති -** ආස්වාදය හේතුවෙන් සසර දුක නැවත නැවත උදා වේ. සියල්ල නැවත නැවත හට ගනියි. ආස්වාදය නැවත දුක නම් වූ උපත ඇති කරන ධර්මයයි. ආස්වාදය හේතුවෙන් රැස්වන කර්ම ශක්තියෙන් නැවත නැවත ජාතිය සකස් කරයි. ජාතිය පහළ වූ කල්හී දුක්ඛස්කන්ධය පහළ වේ. (ජාති පච්චයා ජරා මරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාසං සම්භවන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති).<br>සබ්බං, භික්ඛවෙ, ජාතිධම්මං. කිඤ්ච, භික්ඛවෙ, සබ්බං ජාතිධම්මං? චක්ඛු, භික්ඛවෙ, ජාතිධම්මං. රූපා... චක්ඛුවිඤ්ඤාණං... චක්ඛුසම්ඵස්සො ජාතිධම්මො. යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ජාතිධම්මං...පෙ... මහණ සියල්ල ජාති ධර්ම වේ. මහණ කුමක් ජාති ධර්ම වේද ? ඇස ජාති ධර්මයකි. පෙ ...............<br>එබැවින් ආස්වාදය උපත (සියලු දුක්හී උපත) වශයෙන් නුවණින් දැකිය යුත්තාහ. |
| **සාසවතොති -** ආස්වාදය යනු ආශ්‍රව (ආශාව) නිසා ඇතිවන්නකි. ආශ්‍රව තුලින් ආස්වාදය හට ගනියි. ආස්වාදය නිසා ආශ්‍රව වැඩෙයි. එබැවින් ආස්වාදය, ආශ්‍රව හා බැඳුනු ධර්මයකි. එබැවින් |

| |
|---|
| ආස්වාදය ආශ්‍රව (කිළිටු වූ කුණු වූ ආශාවන්) වශයෙන් නුවණින් දැකිය යුත්තාහ. |
| **ආදීනවතොති -** ආස්වාදය බොහෝ දෝෂ සහිත ය.  බොහෝ කරදර බාධක හිරිහැර කරදර ප්‍රශ්න උදා කරන්නේ ය.<br>කාමානං ආදීනවො සන්දිට්ඨිකො, දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු. කාමය හෙතුකොට, කාමය මුල් කාරණයකොට, කාමය කරණකොට කාමයන් නිසා මෙලොවදීම වින්දයුතුවූ ආදීනව රාශිය, දුක් රාශිය වන්නේය.<br>අප්පස්සාදා කාමා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භියොයා’ති - කාමයෝ ස්වල්ප සැප ඇත්තාහ. බොහෝ දුක් ඇත්තාහ. දැඩි වෙහෙස ඇත්තාහ, මෙහි දොෂ බොහෝ ය. බොහෝ දෝෂ වැඩෙන්නේ ය. එබැවින් ආස්වාදය දෝෂය වශයෙන් නුවණින් දැකිය යුත්තාහ. |
| **ජරාධම්මතොති -** ආස්වාදය හේතුවෙන් සිතද කයද ජරාවට (දුර්වල භාවයට) පත් වෙයි. ආස්වාදයද ජරාවට (දුර්වල භාවයට) පත් වෙයි. ආස්වාදය ඇති කරන සියල්ලද, ආස්වාදය පතා ළං කරගත් සියල්ලද මොහොතින් ජරාවට පත් වෙයි.<br>ජරාධම්මො යොබ්බඤ්ඤෙ, බ්‍යාධිධම්මො ආරොග්‍යෙ, මරණධම්මො ජීවිතෙ. යෞවන භාවයෙහි ජරා ස්වභාවයද නිරොගී බැව්හි ලෙඩවන ස්වභාවයද ජීවත්වීමෙහි මරණ ස්වභාවයද වෙයි.<br>ජීරන්ති වෙ රාජරථා සුචිත්තා - අථො සරීරම්පි ජරං උපෙති<br>සතඤ්ච ධම්මො න ජරං උපෙති - සන්තො හවෙ සබ්භි පවෙදයන්ති’ති. |

විසිතුරු කරනලද රජුන්ගේ රථද දිරති. එසේම ශරීරයද දිරීමට පැමිණෙයි. එහෙත් බුද්ධාදී උත්තමයන්ගේ සද්ධර්මය දිරුමට නොපැමිණේ. එහෙයින් ඒ උත්තමයෝ ඒ සද්ධර්මය (නිවන) ඒකාන්ත පිහිට ලෙස ඔවුනොවුන්ට ප්‍රකාශ කරති.

ජරාධම්මොම්හි ජරං අනතීතොති - මම දිරන ස්වභාව ඇත්තේ වෙමි. ජරාව නො ඉක්ම වූයේ වෙමි. එබැවින් ආස්වාදය ජරාව වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.

බ්‍යාධිධම්මතොති - ආස්වාදය හේතුවෙන් සිතද කයද ව්‍යාධියට පත් වෙයි. ආස්වාදයද ව්‍යාධියට පත් වෙයි. ව්‍යාධි හට ගැනීමට හේතුව ජාතියයි. ජාතියට මූල හේතුව ආස්වාදය කෙරෙහි ඇති තණ්හාවයි. ආස්වාදය ඇති කරන සියල්ලද, ආස්වාදය පතා ළං කරගත් සියල්ලද ව්‍යාධියට පත් වෙයි.

බ්‍යාධිධම්මොම්හි බ්‍යාධිං අනතීතොති - මම ව්‍යාධි හටගන්නා ස්වභාව ඇත්තේ වෙමි. ව්‍යාධි නො ඉක්ම වූයේ වෙමි. එබැවින් ආස්වාදය ව්‍යාධිය වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.

උපද්දවතොති - ආස්වාදය හේතුවෙන් අනේකවිධ උපද්‍රව වලට මුහුණ පෑමට සිදුවෙයි. අපමණ උවදුරු හට ගනියි. එබැවින් ආස්වාදය උපද්‍රවය වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.

භයතොති - ආස්වාදය පතන්නාට අප්‍රමාණ භය උපදී. මරණ භය, රෝග භය, සොර සතුරු භය ආදී නොයෙක් භය උපදී. සතර අපා භය උපදී. නිරන්තර තැති ගැනීම පවතී. ආස්වාදය උදෙසා ළං කරගත් සියල්ල ගැන භයෙන් පසුවන්නට සිදුවෙයි.

| |
|---|
| භායන්ති භික්ඛවේ, කාමානමෙතං අධිවචනං - මහණ, භය යනු කාමයට නමකි.<br>කාමතෝ ජායතී සෝකෝ - කාමතෝ ජායතී භයං<br>කාමතෝ විප්පමුත්තස්ස - නත්ථි සෝකෝ කුතෝ භයං<br>කාමය නිසා ශෝකය හට ගනියි. කාමය නිසා භය හට ගනියි. කාමයෙන් වෙන් වූ විට ශෝකයක් භයක්ද නොමැත.<br>යානි කානිචි, භික්ඛවෙ, භයානි උප්පජ්ජන්ති සබ්බානි තානි බාලතො උප්පජ්ජන්ති - යම්කිසි භයක් උපදිත්ද, ඒ සියලු භය, සියලු විපත් බාලයා කෙරෙහිම උපදිත්. එබැවින් ආස්වාදය භය වශයෙන් නුවණින් දැකිය යුත්තාහ. |
| උපසග්ගතොති - ආස්වාදය හේතුවෙන් විවිධ දුෂ්කරතා, බාධා, අවහිරතා වලට මුහුණ පෑමට සිදු වේ. ආස්වාදය නිවනට බාධාවකි. නිවනට අවහිරතාවකි. එබැවින් ආස්වාදය බාධාව / අවහිරය වශයෙන් නුවණින් දැකිය යුත්තාහ. |
| සොකධම්මතොති - ආස්වාදය හේතුවෙන් සිතෙහි නිරතුරු ශෝකය හට ගනී. ආස්වාදය ශෝකය උදා කරදෙන ධර්මයකි. නොලැබෙන ආස්වාදය නිසාද, ලැබූ ආස්වාදය නිමා වන විටද, ආස්වාදය පතා ළං කරගත් සියල්ල අහිමි වන විටද ශෝකය උපදී. එබැවින් ආස්වාදය යනු ශෝකයට නමකි.<br>කාමතෝ ජායතී සෝකෝ - කාමතෝ ජායතී භයං<br>කාමතෝ විප්පමුත්තස්ස - නත්ථි සෝකෝ කුතෝ භයං - කාමය නිසා ශෝකය හට ගනියි. කාමය |

නිසා භය හට ගනියි. කාමයෙන් වෙන් වූ විට ශෝකයක් භයක්ද නොමැත. **එබැවින් ආස්වාදය සෝකය වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.**

**පරිදෙවධම්මතොති -** ආස්වාදය හැඬුම් වැළපුම් පිණිස හේතු සකසයි. ආස්වාදය පසුපස හඹා යන්නාට හඬන්නට, වැළපෙන්නට නොයෙකුත් කරුණු යෙදෙයි. ආස්වාදය පතා ළං කරගත් සියල්ල අහිමි වන විට වැළපීම උපදී.

කාමෙසු ගිද්ධා පසුතා පමූළ්හා, අවදානියා තෙ විසමෙ නිවිට්ඨා - දුක්ඛූපනීතා පරිදෙවයන්ති, කිංසු භවිස්සාම ඉතො චුතාසෙ. - කාමයන්හි ගිජුවූ ඇලුනාවූ මුළාවූවාවූ, මසුරුකම් ඇති, කාය දුශ්චරිතාදී විෂමයෙහි පිහිටියාවූ, ඒ සත්වයෝ මරණ දුකට පැමිණියාහු මේ ආත්මභවයෙන් මැරීගියාවූ අපි කවර නම් ගතියකට පැමිණෙන්නෙමුදැයි වැළපෙත්. ශෝක කරත්. **එබැවින් ආස්වාදය හැඬීම - වැළපීම වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.**

**උපායාසධම්මතොති -** ආස්වාදය බොහෝ වෙහෙස ඇති කරයි. කායික වෙහෙසද, මානසික වෙහෙසද ඇති කරයි. බලවත් සිත් තැවුල් ඇති කරයි. එබැවින් ආස්වාදය යනු උපායාස ධර්මයකි.

අප්පස්සාදා කාමා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භියොයා’ති - කාමයෝ ස්වල්ප සැප ඇත්තාහ. බොහෝ දුක් ඇත්තාහ. දැඩි වෙහෙස ඇත්තාහ, මෙහි දොෂය බොහෝ ය. **එබැවින් ආස්වාදය බලවත් වෙහෙස වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.**

**සංකිලෙසිකධම්මතොති -** ආස්වාදය සිත රාගයෙන්, ද්වේෂයෙන්, මෝහයෙන් කෙළෙසන

ධර්මයකි. සිතේ පිරිසුදු භාවය නැති කරන ධර්මයකි. ආස්වාදය පතන්නා සැමවිටම අපිරිසුදු සිතකින් වාසය කරයි. එබැවින් ආස්වාදය යනු ක්ලේෂ ධර්මයන්ට නමකි. ක්ලේෂ මාරයාට අයත් ධර්මයකි. **එබැවින් ආස්වාදය සිතේ කෙළෙසීම වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.**

## අනත්ත ලක්ෂණ (06)

**පරතොති -** ආස්වාදය සිත විසින් බුක්ති විඳින්නකි. සිත විසින් කර්ම රැස් කර ගැනීම පිණිස යොදා ගන්නා උපක්‍රමයකි. සිත යනු මම මගේ යනුවෙන් ගත නොහැකි හේතුඵල ධර්මයකි. **එබැවින් ආස්වාදය තමාට අයත් නොවන්නක් අන්සතු වූවක් වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.**

**රිත්තතොති -** ආස්වාදය යනු සිහිනෙන් ලද වස්තුවක් වැනි ය. ආස්වාදය යනු හිස් වූවකි. ආස්වාදය හේතුවෙන් කිසිදා සිත සංතෘප්තියට පත් නොවේ. සෑහීමකට පත් නොවේ. නොපිරේ. **එබැවින් ආස්වාදය හිස් ධර්මයක් වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.**

**තුච්ඡතොති -** ආස්වාදය හේතුවෙන් සිත ලාමක, පහත් ස්වභාවයට පත් වේ. ආස්වාදය හේතුවෙන් ලාමක, පහත් අකුසලයට නැඹුරු වේ. යහපත් උසස් ප්‍රතිඵලයක් අත් නොවේ. **එබැවින් ආස්වාදය ලාමක බව, පහත් ධර්මයක් වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.**

**සුඤ්ඤතොති -** ආස්වාදය සියල්ලෙන් ශූන්‍ය ය. ආස්වාදය යනුවෙන් ඉතිරි වන කිසිවක් නොමැත. ආස්වාදය යනුවෙන් රැස් කරගත හැකි පවත්වාගත හැකි කිසිවක් නැත. එය හුදු හිස් වූ මායාවකි. එබැවින් ආස්වාදය ශූන්‍යතා ධර්මය වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.

**අනත්තතොති -** ආස්වාදය තමන් විසින්ද අනුන් විසින්ද උදා නොකරන්නක් බැවින් වසඟයේ පැවැත්විය නොහැක. එය හේතුඵල ධර්මයක් බැවින් මොහොතකින් විපරිණාමයට යයි. එහි මම මගේ යනුවෙන් අල්ලාගත හැකි කිසිවක් නොමැත. අල්ලාගත හැකි තැනක්ද නොමැත. එබැවින් ආස්වාදය මම වශයෙන් වූ මගේ වශයෙන් වූ ආත්මයක්හී නොපිහිටි ධර්මයක් වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.

**අසාරකතොති -** ආස්වාදය තුළින් උදා වන්නේ සසර දුක්ඛස්කන්ධයයි. දුක්ඛස්කන්ධය තුළ ගතයුතු කිසිදු සාරත්වයක් නොමැත. ආස්වාදය තුළින් කිසිදු සාර වූ සතුටක් හිමි නොවේ. ආස්වාදය අසාර දුකම උදා කර දෙයි. ආස්වාදය තුළ ආත්මීය වශයෙන් ගතහැකි සාරත්වයක්ද නොමැත. එබැවින් එය ආසාර ධර්මයක් වශයෙන් නුවණින් දැකිය යුත්තාහ.

**යස්ස සියා සබ්බදා සති**
**සතතං සබ්බකායෙ උපට්ඨිතා**
**නො චස්ස නො ච මෙ සියා**
**න භවිස්සති න ච මෙ භවිස්සති**
**අනුපුබ්බවිහාරි තත්ථ සො**
**කාලෙනෙව තරෙ විසත්තික'න්ති**

**යමකුගේ සිහිය හැමකල්හිම මෙසේ සියලු කායන් (නාම කාය + රූප කාය = නාමරූප) අනුව නුවණින් බැලීමට පැමිණ සිටින්නේද, පෙර ක්ලේෂ නොවූයේ නම් ඉදින් මේ අත්භවය නො නොවන්නේ ය. මේ අත්භවෙහි ක්ලේෂ නොවන්නේද, එසේ නම් මත්තෙහි විපාක වෘත්තයෙක්ද නොවන්නේය, මත්තෙහි මම යනුවෙන් කිසිවක් නොවන්නේය යි මෙසේ අනුපූර්ව විහාර ඇත්තා වූ යොගාවචර තෙම, පස් ඉඳුරන් මුහුකුරා ගිය කල්හි විසත්තිකා (ආස්වාදය - කාමය කෙරෙහි ඇති ඇල්ම) යයි කියන ලද තෘෂ්ණාව තරණය කරන්නේ ය.**

# අසුභ අනුපස්සනා

| ආස්වාදයෙහි අසුභය දැකීම | ශරීරයෙහි අසුභය දැකීම |
| --- | --- |
| ඛුද්දකනිකාය / ඉතිවුත්තකපාළි / තිකනිපාතො / චතුත්ථවග්ගො / අසුභානුපස්සීසුත්තං<br><br>වුත්තඤ්හෙතං භගවතා, වුත්තමරහතාති මෙ සුතං, අසුභානුපස්සී, භික්ඛවෙ, කායස්මිං විහරථ, ආනාපානස්සති ච වො අජ්ඣත්තං පරිමුඛං සූපට්ඨිතා හොතු, සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සිනො විහරථ.<br><br>මහණෙනි, කායන්හී (★සබ්බ කාය) අසුභය නුවණින් බලන්නෝ්ව වසවු. නිවනේ සිහිය පිහිටුවා ආශ්වාස ප්‍රශ්වාසය හා අනුගතව සියලු සංඛාර පිළිබඳ අනිච්චානුපස්සනාවෙන් යුක්තව වාසය කරව්.<br><br>අනිච්චානුපස්සී අස්සසිස්සාමී’ති සික්ඛති, | කායානුපස්සනා පටිකූලමනසිකාරපබ්බං<br><br>ඉමමෙව කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තවපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති - අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තවො, මංසං නහාරු අට්ඨී අට්ඨිමිඤ්ජං වක්කං, හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං, අන්තං අන්තගුණං උදරියං කරීසං මත්ථලුඞ්ගං, පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්ත’න්ති.<br><br>පාදාන්තයෙන් උඩ හිසකේ මස්තකයෙන් |

අනිච්චානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති, විරාගානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, විරාගානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති, නිරොධානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, නිරොධානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති, පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති.

අනිච්චානුපස්සනාවෙන් යුක්තව (සියල්ලෙහි උදය වය දකිමින්) හුස්ම ගනිමියි හික්මෙයි. අනිච්චානුපස්සනාවෙන් යුක්තව හුස්ම හරිමියි හික්මෙයි. විරාගානුපස්සනාවෙන් යුක්තව (සියල්ලෙන් වෙන් විය යුතු බව සිහි කරමින්) හුස්ම ගනිමියි හික්මෙයි. විරාගානුපස්සනාවෙන් යුක්තව හුස්ම හරිමියි හික්මෙයි. නිරෝධානුපස්සනාවෙන් යුක්තව (අවිජ්ජා තණ්හා හේතු නිරෝධයෙන් සියල්ල නිරුද්ධ වන බව දකිමින්) හුස්ම ගනිමියි හික්මෙයි. නිරෝධානුපස්සනාවෙන් යුක්තව හුස්ම හරිමියි හික්මෙයි. පටිනිස්සග්ගානුපස්සනාවෙන් යුක්තව (සියල්ල දුරු කළ යුතු බව සිහි කරමින්) හුස්ම ගනිමියි හික්මෙයි.

යට, සම කෙළවර කොට ඇති නානාවිධ අසුචියෙන් (අපවිත්‍ර ද්‍රව්‍යයෙන්) පිරී ඇති මේ ශරීරය පිළිබඳ සිහි කරන්නේ ය. (කෙසේද යත්) මේ ශරීරයෙහි හිසකෙස්ය, ලොම්ය, නියපොතුය, දෙතිස් දත්ය, සමය, මාංශය, නහරය, ඇටය, ඇටමිදුළුය, වකුගඩුය, හදවතය, අක්මාවය, පෙණහළුය, දළබුවය, බඩදිවය, කුඩා බඩවැලය, මහ බඩවැලය, නොදිරූ ආහාරය, මළය, හිස් මොළය, පිතය, සෙමය, සැරවය, ලෙහෙය, ඩහදියය, මේද තෙලය, කඳුළුය, වුරුණු තෙලය, කෙළය, සොටුය, සඳ මිදුළුය, මුත්‍රාය, යන මේ දෙතිස් කුණපයෝ ඇත්තාහ.

සෙය්‍යථාපි, භික්ඛවෙ, උභතොමුඛා මුතොලි පූරා නානාවිහිතස්ස ධඤ්ඤස්ස, සෙය්‍යථීදං සාලීනං වීහීනං මුග්ගානං මාසානං තිලානං තණ්ඩුලානං.තමෙනං චක්ඛුමා පුරිසො මුඤ්චිත්වා පච්චවෙක්ඛෙය්‍ය - ඉමෙ සාලී, ඉමෙ වීහී ඉමෙ මුග්ගා ඉමෙ මාසා ඉමෙ තිලා

පටිනිස්සග්ගානුපස්සනාවෙන් යුක්තව හුස්ම හරිමියි හික්මෙයි.

අසුභානුපස්සිනං, භික්ඛවෙ, කායස්මිං විහරතං යො සුභාය ධාතුයා රාගානුසයො සො පහීයති. ආනාපානස්සතියා අජ්ඣත්තං පරිමුඛං සූපට්ඨිතිතාය යෙ බාහිරා විතක්කාසයා විඝාතපක්ඛිකා, තෙ න හොන්ති.

සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සිනං විහරතං යා අවිජ්ජා සා පහීයති, යා විජ්ජා සා උප්පජ්ජතී'ති.

මහණෙනි, කායන්හී අසුභය බලමින් වසන්නවුන් හට සුභ සංඥාවෙන් උපදින කාම රාගානුසයයෙක් වේද, ඒ අනුසය පහවෙයි. නිවනේ පිහිටුවන ලද සිහියෙන් යුක්තව ආශ්වාස ප්‍රාශ්වාස හා අනුගතව අනුපස්සනාව වැඩුණු කල්හි, බාහිර වූ ආසයානුගත වූ යම් (කාමවිතර්කාදී) මිථ්‍යා විතර්කයෝ වෙද්ද, දුක් පක්ෂයෙහි වැටෙන්නා වූ මිථ්‍යා සංකල්පනාවෝ වෙද්ද, ඒ සියල්ල පහවෙත්.

ඉමෙ තණ්ඩුලා'ති. එවමෙව ඛො, භික්ඛවෙ, භික්ඛු ඉමමෙව කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති.

මහණෙනි, නොයෙක් ආකාරවූ ධාන්‍යයන්ගෙන් පුරවනලද උඩ යට දෙපැත්තෙන් කටවල් දෙකක් ඇති මල්ලක් වේද, කිනම් ධාන්‍යවලින් යුත් මල්ලක්ද යත්? හැල්වීය, මහවීය, මුංය, මෑය, තලය, සහල්ය, (යනමේ ධාන්‍යවලිනි). ඇස් ඇති පුරුෂයෙක් ඒ ධාන්‍ය පිරූ මල්ල (මුදා) ලිහා මේ හැල්වීය, මේ මහවීය, මේ මුංය, මේ මෑය, මේ තලය, මේ සහල් යයි යම්සේ මෙනෙහි කරන්නේද, එපරිද්දෙන්ම මහණෙනි, යොගාවචර තෙම පාදාන්තයෙන් උඩ හිසකේ මස්තකයෙන් යට, සම කෙළවර කොට ඇති නොයෙක් ආකාර අසුචි වලින් පිරුණා වූ මේ ශරීරයම සිහි කරන්නේ ය.

සියලු සංඛාර පිළිබඳ අනිච්චානුපස්සනාවෙන් යුක්තව වාසය කරන්නවුන්ගේ අවිද්‍යාව වේද, ඕ තොමෝ පහවෙයි. මාර්ග ඥාණය - විද්‍යාව වේද, ඒ ඕ තොමෝ උපදී.

අසුභානුපස්සී කායස්මිං, ආනාපානෙ පටිස්සතො
සබ්බසඞ්ඛාරසමථං, පස්සං ආතාපි සබ්බදා
ස වෙ සම්මද්දසො භික්ඛු, යතො තත්ථ විමුච්චති
අභිඤ්ඤාවොසිතො සන්තො, ස වෙ යොගාතිගො මුණී'ති

කායන්හී අසුභය අනුව බලන්නා වූ, ආශ්වාස ප්‍රශ්වාස හා අනුගත එළඹ සිටි සිහිය ඇත්තා වූ, සියලු සංඛාරයන්ගේ සංසිඳීම නම් නිවන දක්නා වූ, හැමදා කෙළෙස් තවන වීර්යය ඇත්තා වූ, ලෝකෝත්තර සම්මා දිට්ඨියෙන් යුක්ත වූ, විමුක්තිය පිණිසම වෑයම් කරන්නා වූ, ඒ මහණතෙම ඒකාන්තයෙන් ඒ රාගාදී කෙළෙස් සංසිඳ වූ නිවනෙහි වැස කාමාදි ඕසයන් තරණය කළ ශාන්ත මුණිවරයා වන්නේ ය.

සංයුත්තනිකාය / සළායතනවග්ගපාළි / සළායතනසංයුත්තං / ගහපතිවග්ගො / භාරද්වාජසුත්තං

කො නු ඛො, භො භාරද්වාජ, හෙතු කො පච්චයො යෙනි මෙ දහරා භික්ඛූ කාළකෙසා භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතා පඨමෙන වයසා අනිකීළිතාවිනො කාමෙසු යාවජීවං පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරන්ති, අද්ධානඤ්ච ආපාදෙන්තී'ති?

භාරවාජ සථවිරයන් වහන්ස, යම් හෙයකින් මෙ තරුණ වූ කළු කෙස් ඇත්තා වූ භද්‍ර වූ යෞවන භාවයෙන් යුක්තවූ ප්‍රථම වයසෙහි සිටියා වූ පඤ්චකාමයන්හි නොකළ ක්‍රීඩා ඇත්තා වූ භික්ෂූහු දිවිහිමියෙන් සම්පූර්ණකොට පිරිසිදු කොට බ්‍රහ්මචර්‍යාවෙහි හැසිරෙත්ද, දීර්ඝ කාලයක්

★සබ්බ කාය
චක්ඛු කාය - රූප කාය
සෝත කාය - සද්ද කාය
ඝාන කාය - ගන්ධ කාය
ජිව්හා කාය - රස කාය
කාය කාය - ඵොට්ඨබ්බ කාය
මනෝ කාය - ධම්ම කාය

සම්පාදනය කෙරෙත්ද, ඒ හේතුව කවරේ ද, ඒ ප්‍රත්‍යය කවරේ ද ?

වුත්තං ඛො එතං, මහාරාජ, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන - එථ තුම්හෙ, භික්ඛවෙ, මාතුමත්තීසු මාතුචිත්තං උපට්ඨපෙථ, භගිනිමත්තීසු භගිනිචිත්තං උපට්ඨපෙථ, ධීතුමත්තීසු ධීතුචිත්තං උපට්ඨපෙථා’ති. අයං ඛො, මහාරාජ, හෙතු, අයං පච්චයො යෙනිමෙ දහරා භික්ඛූ සුසූ කාළකෙසා භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතා පඨමෙන වයසා අනිකීළිතාවිනො කාමෙසු යාවජීවං පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරන්ති, අද්ධානඤ්ච ආපාදෙන්තී’ති.

මහරජ, සියල්ල දන්නා වූ ධර්මයන් දක්නා වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින්, මහණෙනි, එව් තෙපි මව්

| | |
|---|---|
| | පමණ ඇත්තියන් කෙරෙහි මව් ය යන සිත එළවව්. නැගණියන් පමණ ඇත්තියන් කෙරෙහි නැගණියන් ය යන සිත එළවව්. දියණියන් පමණ ඇත්තියන් කෙරෙහි දියණියන් ය යන සිත එළවව් යයි මෙසේ වදාරණ ලදී.<br><br>මහරජ, යම් හෙයකින් මේ තරුණවූ කළු කෙස් ඇත්තා වූ භද්‍ර යෞවන භාවයෙන් යුක්ත වූ පළමුවන වයසින් යුක්තවූ පඤ්චකාමයන්හි නොකරන ලද ක්‍රීඩා ඇත්තා වූ භික්ෂූහු දිවිහිමියෙන් සම්පූර්ණකොට පිරිසිදු කොට බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙත්ද, බොහෝ කාලයකුත් සම්පාදනය කෙරෙත්ද, මේ වනාහි ඒ හේතුව වේ, ප්‍රත්‍යය වේ.<br><br>ලොළං බො, හො භාරද්වාජ, චිත්තං. අප්පෙකදා මාතුමත්තීසුපි ලොභධම්මා උප්පජ්ජන්ති, භගිනිමත්තීසුපි ලොභධම්මා |

| | |
|---|---|
| | උප්පජ්ජන්ති, ධීතුමත්තීසුපි ලොභධම්මා උප්පජ්ජන්ති. අත්ථි නු ඛො, භො භාරද්වාජ, අඤ්ඤො ච හෙතු, අඤ්ඤො ච පච්චයො යෙනිමෙ දහරා භික්ඛූ සුසූ කාළකෙසා...පෙ.... අද්ධානඤ්ච ආපාදෙන්තී’ති?<br><br>පින්වත් භාරවාජ ස්ථවිරයන් වහන්ස, හිත ලොල්ය. සමහරවිටක මව් සමාන ඇත්තියන් කෙරෙහිද ලෝභ සිත් උපදිත්. නැගණියන් සමාන තැනැත්තියන් කෙරෙහිද ලෝභ සිත් උපදිත්. දියණියන් සමාන තැනැත්තියන් කෙරෙහිද ලෝභ සිත් උපදිත්. භාරවාජ ස්ථවිරයන් වහන්ස, යම් හේතුවකින් මේ තරුණ වූ කළු කෙස් ඇත්තා වූ භද්‍ර වූ යෞවන භාවයෙන් යුක්තවූ පළමුවන වයසින් යුක්ත පඤ්චකාමයන්හි නොකරන ලද ක්‍රීඩා ඇත්තා වූ භික්ෂූහු දිවිහිමියෙන් සම්පූර්ණකොට පිරිසිදු කොට බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙත්ද, බොහෝ කාලයකුත් සම්පාදනය කෙරෙත්ද, ඒ අනික් |

| | |
|---|---|
| | හේතුවකුත් ඇත්තේද, අනික් ප්‍රත්‍යයකුත් ඇත්තේද ?<br><br>වුත්තං ඛො එතං, මහාරාජ, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන - එථ තුම්හෙ, භික්ඛවෙ, ඉමමෙව කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛථ - අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො, මංසං නහාරු අට්ඨී අට්ඨිමිඤ්ජං වක්කං, හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං, අන්තං අන්තගුණං උදරියං කරීසං මත්ථලුඞ්ගං, පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්ත’න්ති.<br><br>අයම්පි ඛො, මහාරාජ, හෙතු, අයං පච්චයො යෙනිමෙ දහරා භික්ඛූ සුසූ |

| | |
|---|---|
| | කාළකෙසා...පෙ.... අද්ධානඤ්ච ආපාදෙන්තී'ති.<br><br>මහරජ, සියල්ල දන්නා වූ සියලු ධර්‍මයන් දක්නාවූ අර්හත් වූ සම්‍යක් සම්බුඩවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින්, මහණෙනි, තෙපි එව්, පාදාන්තයෙන් උඩ හිසකේ මස්තකයෙන් යට, සම කෙළවර කොට ඇති නානාවිධ අසුචියෙන් (අපවිත්‍ර ද්‍රව්‍යයෙන්) පිරී ඇති මේ ශරීරය පිළිබඳ සිහි කරන්නේ ය. (කෙසේද යත්) මේ ශරීරයෙහි හිසකෙස්ය, ලොම්ය, නියපොතුය, දෙතිස් දත්ය, සමය, මාංශය, නහරය, ඇටය, ඇටමිදුළුය, වකුගඩුය, හදවතය, අක්මාවය, පෙණහළුය, දළබුවය, බඩදිවය, කුඩා බඩවැලය, මහ බඩවැලය, නොදිරූ ආහාරය, මළය, හිස් මොළය, පිතය, සෙමය, සැරවය, ලෙහෙය, ඩහදියය, මේද තෙලය, කඳුළුය, වුරුණු තෙලය, කෙළය, සොටුය, සඳ මිදුළුය, මුත්‍රාය, යන මේ දෙතිස් කුණපයෝ ඇත්තා හයි නුවණින් මෙනෙහි |

<table>
<tr>
<td></td>
<td>කරව් යනුවෙන් වදාරණ ලදී.<br><br>මහරජ, යම් හෙයකින් මේ තරුණවූ කළු කෙස් ඇත්තා වූ භද්‍ර යෞවන භාවයෙන් යුක්ත වූ පළමුවන වයසින් යුක්තවූ පඤ්චකාමයන්හි නොකරන ලද ක්‍රීඩා ඇත්තා වූ භික්ෂූහු දිවිහිමියෙන් සම්පූර්ණකොට පිරිසිදු කොට බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙත්ද, බොහෝ කාලයකුත් සම්පාදනය කෙරෙත්ද, මේ වනාහි ඒ හේතුව වේ, ප්‍රත්‍ය වේ.</td>
</tr>
<tr>
<td colspan="2">යෙ භික්ඛවෙ, කෙචි කුසලා ධම්මා, සබ්බෙ තෙ අප්පමාදමූලකා අප්පමාදසමොසරණා. අප්පමාදො තෙසං අග්ගමක්ඛායතී’ති.<br><br>මහණෙනි, යම්තාක් කුසල ධර්ම වෙත්ද, අප්‍රමාදය මුල්කොට ඇත්තාහ. අප්‍රමාදයෙහි රැස් වන්නාහ. ඒ ධර්මයන්ට අප්‍රමාදය ශ්‍රේෂ්ඨයයි කියනු ලැබේ.<br><br>අප්පමාදො අමත පදං - අප්‍රමාද වූවෝ අමරණීයහ.</td>
</tr>
</table>

**සම්පාදනය - සුසිල හිමි**